**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**<u>කොළඹ</u>**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ හැටන්, බොගවන්තලාව, බ්‍රිඩ්වෙල් වතුයායේ ඉදිකරන ලද නිවාස 155ක් ජනතා අයිතියට පත් කිරීම</u>**

2019 පෙබරවාරි 24 වන දින හැටන්, බොගවන්තලාව, බ්‍රිඩ්වෙල් වතුයායේ පවත්වන ලද විශේෂ උත්සවයකදී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව නිවාස 155ක් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා විසින් ජනතා අයිතියට පත් කෙරිණ.

මෙම අවස්ථාව සඳහා උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා , පාර්ලිමේන්තු මන්ත්‍රීන් හා මධ්‍යම පළාත් සභාවේ සාමාජිකයන් , වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරින් (PHDT), ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙ නියෝජිතායතනය වන රතු කුරුස සංවිධානයේ නිලධාරින්, බෝගවන්තලාව ප්‍රාදේශීය වැවිලි සමාගමෙ නියෝජිතයින් සහ වතුයායේ වෙසෙන විශාල පිරිසක්ද මෙම උත්සවයට සහභාගි වූහ.

මෙම උත්සවය අමතමින් මහ කොමසාරිස්තුමා අලුතින් ඉදි කරන ලද නිවාසවල හිමිකරුවන්ට සිය සුබ පැතුම් එක් කළේය. ඇමරිකානු ඩොලර් මිලියන 350ක (ශ්‍රී ලංකා රුපියල් බිලියන 50ක් පමණ) මූල්‍ය ප්‍රදාන යටතේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ඉන්දීය ආධාර යටතේ විදේශ රටක ක්‍රියාත්මක විශාලතම ආධාර ව්‍යාපෘතිය බව එතුමා පැවසීය. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට නියමිත නිවාස 63,000 න් නිවාස 47,000ක් මේ වන විට ඉදිකර අවසන් බවද එතුමා සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප් රමුඛතාවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉන්දියාව නිරතුරුවම සහයෝගය ලබා දෙන බව සිහිපත් කළ මහ කොමසාරිස්තුමා ඉන්දියානු රජය සහ

ජනතාව සාමය හා සමෘද්ධිය වෙත පියමනින ශ්‍රී ලාංකේය ජනතාව සමඟ නිබඳව සිටින බව අවධාරණය කළේය.

මෙම උත්සවය අමතමින් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාට හා ඉන්දීය රජයට ශ්‍රී ලංකාව වෙත ලබා දෙන සංවර්ධන සහයෝගීතාව සඳහා සිය ස්තූතිය පළ කළේය.

****

කොළඹ

2019 පෙබරවාරි 25